**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 18ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් පුද්ගලයා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියමයන්ට අනුව අරමුදලේ නිශ්චිත නිලධාරී (Specified Officer) තනතුරෙහිද කටයුතු කළ යුතු වේ.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - රක්ෂණ (HM 2-1)

**බාහිර අයදුම්කරුවන්**

රක්ෂණ සහ අවදානම් කළමනාකරණ/ව්‍යාපාර පරිපාලන/ රක්ෂණ, වාණිජ්‍ය, මූල්‍ය, අලෙවිකරණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ උපාධියක් හෝ අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

බ්‍රිතාන්‍ය වරලත් රක්ෂණ ආයතනය වෙතින් ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership) (ACII)

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 18ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද සහ ඉන් අවුරුදු 5ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්දක් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම
2. අදාල විෂය ක්ෂේත්‍රයේ වසර 03ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 1-3) සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

**සහ**

බ්‍රිතාන්‍ය වරලත් රක්ෂණ ආයතනය වෙතින් ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership) (ACII)

**වැටුප් පරිමාණය :** HM 2-1-2025-Rs [161,140-12X4,850-219,340]

(කළමනාකරණ සේවා චක්‍රලේඛ : 01/2025 අනුව 2025/01/01 සිට රු.119,494.00, 2026/01/01 සිට රු.140,317.00 සහ 2027/01/01 සිට රු.161,140.00)

**අනෙකුත් දීමනා :**

- ප්‍රවාහන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (i) අනුව)
- ඉන්ධන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (ii) අනුව)
- වෘත්තීය දීමනාව (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)
- වෛද්‍ය රක්ෂණාවරණය

**වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම්** : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2025.08.20 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,**
**කොළඹ 02.**